# බුදුදහමින් භෞතික සංවර්ධනය අධෛර්යමත් කරන බවට නැගෙන චෝදනාව පිළිබඳ දකුණු ආසියාතික ථෙරවාද බෞද්ධ රටවල් ඇසුරෙන් සිදුකරන විමර්ශනයක්

ඊ. ඩබ්. ඒ. හසිනි සංදීපනී[1]

## හැඳින්වීම

ආචාර්ය රිචඩ් ඒ. ගාර්ඩ් වත්මන් ආර්ථික විද්‍යාව විධිමත් ආර්ථික විද්‍යාවක් බවට පරිවර්තනය කර ගැනීමට බුදුදහමේ උපයෝගීතාව මතුකර පෙන්වයි. බුදුසමය යෝජනා කරන සංවර්ධනයේ නිම් වළලු තරණය කිරීම සඳහා සන්තානගත පරිවර්තනයක් මෙන් ම සමාජගත පරිවර්තනයක් ද අත්‍යවශ්‍ය වේ. එනම් බුදුසමය අසාර්ථක අනර්ථකාරි න්‍යායන් වෙනුවට සංවර්ධනයේ දී මනුෂ්‍යත්වය මුල්තැන් හි තබයි. එහි දී මහාචාර්ය මැක්ස් වේබර්, මෙල්පඩ් ඊ. ස්පයිරෝ, හෙන්ස් බෙෂ්ට් වැන්නන් විසින් මතුකරන බුදුදහම නිසා ථෙරවාද බෞද්ධ රටවල් ඌන සංවර්ධනය වී ඇති බවට නැගෙන චෝදනාව පදනම් විරහිත වූවකි. මෙමගින් දකුණු ආසියාතික බෞද්ධ රටවල් බුදුදහම නිසා ඌන සංවර්ධනය වී ඇති බවට නැගෙන චෝදනාව පිළිබඳ පර්යේෂණයට ලක් කෙරෙයි.

## පර්යේෂණ ක්‍රමවේදය

ගුණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමවේදය මත පදනම්ව ප්‍රාථමික හා ද්විතියික මූලාශ්‍රය භාවිත කරමින් දත්ත රැස්කිරීම.

## සාකච්ඡාව

ධනවාදී සමාජ ආර්ථික පසුබිමක් බිහිවීමත් සමග ලෝකයේ එක් අන්තයක මිනිසුන් වෙත ධනය ප්‍රාදූර්භූත වෙද්දී තවත් අන්තයක් කුසට අහරක්, හිසට සෙවණක්, ශරීරයට වස්ත්‍රයක් වෙනුවෙන් අරගල කරයි. මෙසේ ආර්ථිකයේ ධනවාදයටත් සමාජවාදයටත් මැදි වී හෙම්බත් වී සිටින මිනිසාට අන්තවාදී නොවූ භෞතික හා ආධ්‍යාත්මික සංවර්ධනයක අවශ්‍යතාව මතුව ඇති බව පෙනේ. සංවර්ධනය යනු නූතනය වනවිට බොහෝ ක්ෂේත්‍රමය වශයෙන් අවධානයට මෙන් ම අභියෝගයට ලක්ව ඇති ක්ෂේත්‍රයකි. සංවර්ධන කාර්යය කෙරෙහි සමාන පිළිවෙතක් ක්‍රියාත්මක කිරීම සංවර්ධනයේ උපරිමය ළඟා කරගැනීමට හේතු වේ. සංවර්ධන සන්දර්භය තුළ ආර්ථික සංවර්ධනය ප්‍රමුඛ කාරණාවක් වන අතර 20 වන සියවස වන විට ලෝකයේ රටවල් සංවර්ධිත හා ඌන සංවර්ධිත රටවල් ලෙස පැහැදිලි විභජනයක් දක්නට ලැබිණි. මානව ශිෂ්ටාචාර ආරම්භයේ පටන් ම ආර්ථිකය සම්බන්ධ යම් තත්වයන්වලට

1. කොළඹ විශ්වවිද්‍යාලය, කොළඹ 03, 00300, ශ්‍රී ලංකාව. hasini.sandeepani0525@gmail.com

මානවයා මුහුණ දුන් අතර නූතනය වනවිට මිනිස් අවශ්‍යතා සංකීර්ණ වීම නිසා ද භෞතික සංවර්ධනය සම්බන්ධ නොයෙක් ගැටලුවලට මිනිසා මුහුණ දෙමින් සිටියි. විශේෂයෙන්ම එහි දී නූතන ලෝකයට ගැළපෙන නව ආර්ථික දර්ශනයක් ලෙස බෞද්ධ ආර්ථික දර්ශනය උගතුන්ගේ අවධානයට ලක් වී ඇත. බුදුදහම මඟින් මිනිසාට, සමාජයට ගැළපෙන පරිදි ධාර්මික ධනෝපාර්ජන ක්‍රමවේදයක්, බුද්ධිමත් ධන විසර්ජන ප්‍රතිපත්තියක්, සංරක්ෂණශීලී ක්‍රියා පිළිවෙතක් ඉදිරිපත් කොට ඇත. නමුත් ඒ අනුව ඇතමෙක් ස්වකීය ජීවන පැවැත්ම හා නොගළපමින් බුදුසමය අසමාජීය දර්ශනයක් බවත්, භික්ෂූන් වහන්සේලාට කරන ලද දේශනා බවත්, ඓහලෞකික දියුණුව සඳහා නොව පාරලෞකික දියුණුව සඳහා මග පෙන්වන බවත් වැනි පදනම් විරහිත චෝදනා හුවා දක්වමින් බෞද්ධ ජීවන ක්‍රමය මතුකරන බෞද්ධ ආර්ථික ක්‍රමවේදය අනුකරණය කිරීමට මැලිවෙති. විශේෂයෙන් දකුණු ආසියාතික ජනතාව බුදුදහම යැයි හඳුනා ගනිමින් එල්බ සිටින මිථ්‍යා මතවාද හමුවේ ආර්ථික අභිවෘද්ධියක් මිනිසා වෙතින් අපේක්ෂා කළ නොහැකි වීම පොදු තත්වයකි. වර්තමාන ආර්ථික ප්‍රවණතාවත් සමඟ අසීමිත ලෙස ධනය එක් පක්ෂයකට කේන්ද්‍රගත වූ අතර 20 වන සියවසේ බිහි වූ ධනවාදී ආර්ථිකයත් සමඟ ධනවාදයේ හෝ සමාජවාදයේ ශුද්ධ බව රැකීමට කිසිඳු රටක් සමත් වූයේ නැත. එමනිසා භෞතික මෙන් ම ආධ්‍යාත්මික දෙයංශයේ ම සංවර්ධනයක් ඇති ආචාර ධර්ම මත ගොඩ නැගුණු ආර්ථිකයක අවශ්‍යතාව නූතන ආර්ථික රටාව විමසුමේ දී දැනෙයි. විශේෂයෙන් ම නූතනයේ ධනවාදී ආර්ථිකයේ දී සදාචාරය පිළිබඳ තැකීමක් නොකරන අතර බුදුදහම භෞතික සරුසාරභාවය හා ආධ්‍යාත්මික සරුසාරභාවය යන දෙක ම අවධාරණය කරමින් මිනිස් ශ්‍රමය, ආශාවන්ගේ සීමිත බව, පරිසර හිතකාමී බව යන කාරණා කෙරෙහි අවධානය යොමු කර ඇත. බෞද්ධ ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේ දී අවම භාණ්ඩ පරිභෝජනයක් තුළින් නියමිත අන්තය කරා ගමන් කළ යුතු ආකාරය පෙන්වා දෙමින් කූටදන්ත ආදී සූත්‍ර විමසීමේ දී පෙනී යන්නේ සංවර්ධන ක්‍රියාවලිය හැකි තරම් සොබාදහමට සමීප විය යුතු අතර සොබාදහම අතික්‍රමණය කරන්නක් නොවිය යුතු බව යි. කෙසේවෙතත් ආධ්‍යාත්මික සංවර්ධනයත් භෞතික සංවර්ධනයත් එකිනෙක සාපේක්ෂ විය යුතු අතර බුදුදහමේ සංවර්ධනය පිළිබඳ ස්ථාවරය විමසීමේ දී පෙනී යන්නේ ආධ්‍යාත්මික සංවර්ධනයෙන් තොර ආර්ථික සංවර්ධනය මිනිස් සමාජයේ යහපත පිණිස හේතු නොවන බව යි. බුදුදහම සංවර්ධන චින්තනයක් වන අතර එහි කුඩා අවධියේ පටන් මනා ශාස්ත්‍රීය හා ශිල්පීය කුසලතාවක් ලබාගනිමින් ශික්ෂණයෙන් යුක්තව පුද්ගලයාගේ ආගමික, සමාජ හා ආධ්‍යාත්මික චර්යාවන් මනාව පවත්වා ගනිමින් උසස් ආධ්‍යාත්මිකත්වයක් කරා ප්‍රවේශ වන ආකාරය මනාව දක්වා තිබේ. සංවර්ධනය තනි පුද්ගල වශයෙන් මෙන් ම සමස්ත සමාජයක ම සංවර්ධනයක් සිදු විය යුතු අතර කූටදන්ත සූත්‍රානුගතව රටක් සංවර්ධනය වීමට සැලසුමක් අවශ්‍ය බව "ඉමං සංවිධානං ආගම්ම" වශයෙන් පෙන්වා දෙයි. බුදුසමය එසේ යෝජනා කරන සංවර්ධන ප්‍රතිපත්ති සැලසුම්කරණයේ දී ධාර්මිකත්වයත් සංවර්ධනයේ ප්‍රගතිය සතුට පදනම් කරගෙනත් මනිනු ලබයි. මිනිසාගේ පැවැත්මට අදාළ වන සාධකයන්ගේ උච්චාවචනයන් සිදුවීම සාමාන්‍ය ස්වභාවය වුව ද ජීවිතයේ මූලික අවශ්‍යතාවන් අපහසුවකින් තොරව සපුරා ගනිමින් සමෘද්ධිමත් ආර්ථිකයක උරුමකරුවෙකු වන්නේ කෙසේද යන වගට අදාළ බොහෝ ඉගැන්වීම් පෙළ සාහිත්‍යයෙන් ඉදිරිපත් වේ. සංවර්ධනය ඕපපාතිකව සිදුවන්නක් නොවන බවත් ඒ වෙනුවෙන් අප්‍රතිහත උත්සහායක් කළ යුතු බවත් බුදුදහම අවධාරණය කරන අතර බාහිර වශයෙන් වන සංවර්ධනය පමණක් රටක පැවැත්මට

ඉවහල් නොවන බව ද පෙන්වාදෙයි. පටිච්චසමුප්පාදය, ත්‍රිලක්ෂණය, චතුරාර්ය සත්‍යය යනා දී මූලික බෞද්ධ ඉගැන්වීම් නිසා බුදුදහම අශුභවාදයක් බවට මතුපිටින් අධ්‍යයනය කරමින් මත පළ වුණත් බුදුදහම තරම් ගෘහස්ථ ජීවිතයට අනුශාසනා ලබා දෙන වෙනත් දර්ශනයක් ලොව දැකිය නොහැකි ය. පුද්ගලයාගේ පාරලෞකික සාර්ථකත්වයට පෙරාතුව ඓහලෞකික සාර්ථකත්වයට අවශ්‍ය ඉගැන්වීම් රැසක් මහා මංගල, සිඟාලක, චක්කවත්ති සීහනාද, කූටදන්ත, අග්ගඤ්ඤ, ඉණ, පායාසි, වණිජ්ජා, ද්විචක්ඛු, පංච ඉට්ඨධම්ම, අණන, ව්‍යග්ඝපජ්ජ, රාසිය, පත්තකම්ම, වඩ්ඪී, කාමභෝගී, කසීභාරද්වාජ, පරාභව, නිවාප, සබ්බාසව ආදී සූත්‍ර දේශනාවල සඳහන් වේ. බුදුදහම කිසි කලෙකත් ආධ්‍යාත්මික සංවර්ධනයෙන් තොර භෞතික සංවර්ධනයක් අපේක්ෂා නොකරන අතර බුදුදහමේ ඉගැන්වීම් ගිහි සහ පැවිදි වශයෙන් කොටස් දෙකක් යටතට ගැනෙයි. ඒ අනුව සංවර්ධනය විෂයෙහි ගිහියාගේ අරමුණ එකක් වන අතර පැවිද්දාගේ අරමුණ ඊට වෙනස් වේ. එනම් බෞද්ධ ආර්ථික සංවර්ධනය විෂයෙහි පැවිද්දන් අධෛර්යමත් කරන අතර ගිහි ප්‍රජාව වෙත එවැනි සීමා මායිම් පැනවීමක් සිදු නොකරයි. වත්මන් ලෝකයේ ථෙරවාද, මහායාන හා වජ්‍රයාන ලෙස ප්‍රධාන බෞද්ධ සම්ප්‍රදාය ත්‍රිත්වයක් පවතියි. එම සම්ප්‍රදාය ත්‍රිත්වය අතුරින් ථෙරවාද සම්ප්‍රදාය ශ්‍රී ලංකාව, තායිලන්තය, මියන්මාරය, ලාඕසය, කාම්බෝජියාව යන අග්නි දිග ආසියානු රටවල ව්‍යාප්ත වී පවතියි. මේවා ථෙරවාද කලාපය ලෙස හඳුනාගන්නා අතර එම කලාපයේ අනෙකුත් රටවල් මඟින් ලංකාව "ථෙරවාදී සම්ප්‍රදායේ මහ ගෙදර" වශයෙන් හඳුනා ගනියි. විශේෂයෙන් ම මෙහි දී තායිලන්තයේ, කාම්බෝජයේ සහ ශ්‍රී ලංකාවේ බෞද්ධයන් ආගම හා ආර්ථිකය අතර ශක්තිමත් සම්බන්ධයක් දකින අතර ථෙරවාදී කලාපයේ රටවල් බුද්ධාගම හුදෙක් ආගමික අර්ථයෙන් බැහැරව ජාතික අනන්‍යතාවයේ ප්‍රධාන අංගයක් ලෙස භාවිත කරයි. උදාහරණයක් ලෙස කාම්බෝජයේ සියලුම බෞද්ධයන් පාහේ බුද්ධාගම මත පදනම්ව ජීවනෝපාය සරි කරගනියි. ඒ අනුව කෘෂිකාර්මික ජීවන රටාව, කුලය හා බැඳි සමාජ ක්‍රමය, විවාහය හා පවුල් සංස්ථාව, ආගම ආදී කාරණා නිසා ථෙරවාද කලාපය ලෝකයේ අන්‍ය සංස්කෘතීන්ගෙන් හුදකලා වෙයි. මෙහි දී දකුණු ආසියානු සමාජයේ ඌන සංවර්ධනය යුරෝපානු නිර්ණායක ඔස්සේ විග්‍රහ කරන මැක්ස් වේබර් නමැති මානව විද්‍යාඥයා ආසියානු සමාජයේ ආගම ඊට බලපා ඇති බවට එතුමා විසින් ඉදිරිපත් කරන තර්කය සාධාරණීකරණය කරයි. ඒ අනුව යමින් බොහෝ මානව හා සමාජ විද්‍යාඥයෝ දකුණු ආසයාතික රටවල ඌන සංවර්ධනය හා ආගම අතර සම්බන්ධයන් පවතින බව දැක්වීමට උත්සුක වෙති. නමුත් විමර්ශනයට හා පර්යේෂණයට දිරිගන්වන ආගමක් වන බුදුදහම වර්න් හයිසන්බර්ග් නම් විද්‍යාඥයා පෙන්වා දෙන පරිදි ජපානයේ සංවර්ධනයට බාධාවක් නොවූ බවත් ඒ සඳහා රුකුල් දුන් බවත් බුදුදහමේ එන බොහෝ ඉගැන්වීම් නූතන විද්‍යාත්මක චින්තනයන් හමුවේ වඩාත් පැහැදිලිව අවබෝධ වන බවත් පෙන්වා දෙන අතර ඒ අනුව බුදුදහම නිසා ථෙරවාද බෞද්ධ රටවල් ඌනසංවර්ධනය වී ඇති බවට කෙරෙන චෝදනාව පදනම් විරහිත බවත් බුදුදහමේ එන සංවර්ධන සංකල්පය හඳුනාගෙන තමන් නිරත වන රැකියාව සම්බන්ධව ධාර්මිකත්වය, අවිහිංසාවාදී බව යන සංකල්ප ආරක්ෂා කරගනිමින් සංවර්ධන ඉලක්ක සපුරාගත යුතු ය. ඒ නිසාම ආසියාතික රටවල් ඌන සංවර්ධන රටවල් ලෙස හඳුනාගෙන ඇතත් ඒ රටවල් ආර්ථිකමය වශයෙන් අත්පත් කරගෙන ඇති ඌන සංවර්ධිත යන නාමය බුදුසමයේ ආර්ථික චින්තනය සම්බන්ධයෙන් සාධාරණ නොවේ. චින්තනය, සම්පත්වල වටිනාකම් පිළිබඳ අනවබෝධය, අවම

තාක්ෂණික ඥානය, පරිභෝජන සැලසුම් නොමැතිවීම, ආර්ථිකය හා සමාජ පරිසරය ගළපාගැනීමේ අපොහොසත්කම යන හේතු නිසා සංවර්ධනය මන්දගාමී ස්වභාවයක් පෙන්නුම් කරයි.

**නිගමනය**

නූතන සංවර්ධනය මූලික වශයෙන් ආර්ථික සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කළත් බුදුසමය සංවර්ධනය මනිනු ලැබූවේ භෞතික හා ආධ්‍යාත්මික දියුණුවට සාපේක්ෂවය. කුරා කුහුඹුවකුට හෝ අසාධාරණයක් වන සංවර්ධනයක් බුදුසමය අනුදැන නොවදාළ අතර සංවර්ධනය කෙරෙහි බුදුසමය හෙළු ආචාරාත්මක බව උපයුක්ත කරගනිමින් ඕනෑම සංවර්ධන ඉලක්කයක් සපුරාගත හැකි ය. බුදුදහම අගය කරන උත්සාහය, වීර්යය, කැපවීම, ධාර්මිකත්වය ත්‍රෛකාලයට ම සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ දී වැදගත් වෙයි. ඒ අනුව නූතන සංවර්ධන උපාය මාර්ග පිළිබඳ ව පවා පැරණි දහමක් වන බුදුසමය තුළ අදහස් ගැබ්ව පවතින බව සාමඤ්ඤඵල ආදී සූත්‍රවලින් හෙළිවන අතර ඒ අනුව බුදුදහම නිසා ථෙරවාද බෞද්ධ රටවල් ඌන සංවර්ධනය වී ඇති බවට නැගෙන චෝදනාව සහේතුකව ප්‍රතික්ෂේප කොට දැක්විය හැකි ය.

**මුඛ්‍ය පද:** ඌන සංවර්ධනය, ථෙරවාදි බෞද්ධ රටවල්, බෞද්ධ ආර්ථිකය, භෞතික සංවර්ධනය

**ආශ්‍රිත ග්‍රන්ථ**

*අංගුත්තර නිකාය* (2006). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව, කොළඹ; ලංකාණ්ඩුවේ ප්‍රකාශනය.

අතපත්තු, ඩැනී. (2011). *ආර්ථික විද්‍යා ප්‍රවේශය*, මහරගම: තරංජී ප්‍රින්ටර්ස්.

ධම්මජෝති හිමි, බෙලිගල්ලේ. :2012). *බෞද්ධ ආර්ථික දර්ශනය*, කොළඹ: රත්න පොත් ප්‍රකාශකයෝ.

මද්දුමගේ, මිල්ටන් (2008). *තිරසර සංවර්ධනයේ බෞද්ධ න්‍යාය,* කොළඹ: එස්.ගොඩගේ සහ සහෝදරයෝ.

හෙට්ටිආරච්චි, ධර්මසේන (1994). *මුල් බුදුසමයෙන් හෙළිවන බෞද්ධ ආර්ථික දර්ශනය*, ඉසුරුපාය: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

ශ්‍රී ලංකා මහා බැංකුව (2014). *වාර්ෂික වාර්තාව,* කොළඹ: ශ්‍රී ලංකා මහා බැංකුව.